# වයඹ පළාතේ 1994 අංක .04. දරන අධිකරණ දඩ හැරවීමේ ප්‍රඥප්තිය

( වයඹ ආණ්ඩුකාරවරයා අනුමතිය දුන් දිනය : 1994.12.16 )

අධිකරණය විසින් නියම කරනු ලැබ වයඹ පළාතේ පළාත් සභාවේ 1992 අංක 1 දරන මුදල් (සංශෝධන) ප්‍රඥප්තිය යටතේ අය කරගත් දඩ සහ දණ්ඩන මුදල් වයඹ පළාතේ පළාත් පාලන ආයතන වලට හැරවීමට විධිවිධාන සැලැස්වීම සඳහා වූ ප්‍රඥප්තියකි.

වයඹ පළාතේ පළාත් සභාව විසින් මෙසේ පනවනු ලැබේ :-

**ලුහුඬු නාමය.**

1. මේ ප්‍රඥප්තිය වයඹ පළාතේ 1994 අංක 04 දරන අධිකරණ දඩ හැරවීමේ ප්‍රඥප්තිය යනුවෙන් හඳුන්වනු ලැබේ. මෙම ප්‍රඥප්තියට ආණ්ඩුකාරතුමාගේ අනුමතිය ලැබීමෙන් පසු එය ක්‍රියාත්මක වේ.

**අධිකරණය දඩ හා දණ්ඩන මුදල් පැවරීම.**

2. සංශෝධිත පරිදි වූ වයඹ පළාතේ පළාත් සභාවේ 1992 අංක 1 දරන මුදල් (සංශෝධන) ප්‍රඥප්තිය අනුව පළාත් සභාව විසින්, පළාතේ පිහිටා ඇති අධිකරණය විසින් නියම කරන ලද දඩ හා දණ්ඩන මුදල් අය කරගෙන ඇති අවස්ථාවක, ඉහත කී පරිදි එම දඩ හෝ දණ්ඩන මුදල් අයකර ගත් වර්ෂයේ දෙසැම්බර් මාසයේ තිස් එක්වන දිනයේ සිට අවුරුදු දෙකක කාලයක් ඇතුළත, අදාළ පළාත්පාලන ආයතනයේ ප්‍රධාන නිලධාරියා විසින් ලිඛිතව පළාතේ අමාත්‍ය මණ්ඩලයේ මුදල් විෂය භාර අමාත්‍යවරයා වෙත කරනු ලබන ඉල්ලීමක් මත, පළාත් සභාව විසින් එම දඩ හෝ දණ්ඩන මුදල අදාළ පළාත්පාලන ආයතනයට පැවරිය හැකි ය.

**අධිකරණයේ රෙජිස්ට්‍රාර් වරයාගේ සහතිකය.**

3. 2 වන වගන්තිය යටතේ වූ කිසිම ඉල්ලීමක් එම දඩ හෝ දණ්ඩන මුදල් ගෙවූ දිනය, එම මුදල් අදාළ අධිකරණය විසින් පළාත් සභාවට ප්‍රේෂණය කළ දිනය සහ එම දඩ හෝ දණ්ඩන මුදල නියම කළේ කවර ආඥා පනතක් හෝ පනතක් යටතේ ද යන වග, එහි උපලේඛනයට විශේෂ යොමු කිරීමක් සහිතව ද එම දඩ හෝ දණ්ඩන මුදල් නියම කර අයකර ගත් අධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයා විසින් හෝ ඔහු විසින් තත් කාර්යය සඳහා නම් කළ වෙනත් යම් නිලධරයකු විසින් සහතික කරනු ලැබ ඇත්නම් මිස, එවැනි ඉල්ලීමක් වලංගු නොවිය යුතු ය.

...// 2

අර්ථ නිරූපනය.

4. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ ප්‍රඥප්තියෙහි -

" ප්‍රධාන පරිපාලන නිලධරයා " යන්නෙන් -

(අ) මහ නගර සභාවක් සම්බන්ධයෙන් වූ විට, මහ නගර සභා කොමසාරිස් වරයාද,

(ආ) නගර සභාවක් හෝ ප්‍රාදේශීය සභාවක් සම්බන්ධයෙන් වූ විට එහි ලේකම්වරයාද්

අදහස් වෙයි.

" පළාත්පාලන ආයතනය" යන්නෙන් යම් මහ නගර සභාවක්, නගර සභාවක් හෝ ප්‍රාදේශීය සභාවක් අදහස් වන අතර, ඒ යම් සභාවක් විසින් ක්‍රියාත්මක කරන හා ඉටු කරන බලතල වලට, කාර්ය වලට සහ කර්තව්‍ය වලට අනුරූප වන්නා වූ හෝ සමාන වන්නා වූ බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම හා ඉටු කිරීම සඳහා යම්කිසි නීතියකින් හෝ නීතියක් යටතේ හෝ ඇති කොට පිහිටුවන ලද කවර වූ හෝ අධිකාරියක් ඊට ඇතුළත් වේ.

" පළාත" යන්නෙන්, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ වයඹ පළාත අදහස් වේ.

" පළාත් සභාව" යන්නෙන් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ වයඹ පළාතේ පළාත් සභාව අදහස් වේ.

අනනුකූලතාවක් ඇතිවූ විට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතු බව.

5. මේ ප්‍රඥප්තියේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතු ය.